## ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2015

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (SEC) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 36 දරන සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම් විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

---

### 2.1 මතය

---

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය

අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 08 දිනැති අංක 364/26 දරන කොමිෂන් සභා පත්‍රිකාව | වාහන 03 ක් වෙන්දේසි කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් පරිහරණය කරමින් පැවතුණි. ඒ අතරතුර කාලයේදී රේඛීය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.7,990,000 කට නව වාහනයක් මිලදී ගෙන තිබුණි. |
| (ආ) | 2009 අගෝස්තු 27 දිනැති අංක 249 දරන කොමිෂන් සභා තීරණය | මෝටර් වාහන අත්පත් කර ගැනීමේදී අර්ධ වශයෙන් මූල්‍යයනය කිරීම සඳහා විශේෂිත අවස්ථා යටතේ විධායක නොවන ශ්‍රේණිවල නිලධාරීන්ට පමණක් ආපදා ණය ලබාදීමට කොමිෂන් සභාව තීරණය කර තිබුණද, කොමිෂන් සභාවේ තීරණයට පටහැනිව විධායක ශ්‍රේණියේ නිලධාරියෙකුට මෙම කාර්යය සඳහා රු.1,500,000 ක ආපදා ණය මුදලක් ලබාදී තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.31,936,710 ක අතිරික්තයක් වූ අතර ඊට පටහැනිව ඉකුත් වර්ෂයේ රු.13,190,265 ක ඌනතාවයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.45,126,975 ක වර්ධනයක් දැක්වුණි. ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන වියදම් රු.47,455,621 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

රු.මිලියන 353 ක් වූ මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරු කිරීම් ඇතුළත්ව සමාලෝචිත වර්ෂය සඳහා කොමිෂන් සභාවේ ආදායම රු.මිලියන 382 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ රු.මිලියන 364 ට සාපේක්ෂව (රු.මිලියන 334 ක් වූ සෙස් අරමුදලින් මාරුකිරීම් ඇතුළත්ව) මුළු ආදායමෙහි සියයට 4.9 ක වැඩිවීමක් නියෝජනය විය. සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම රු.මිලියන 55 ක් වූ අතර ඉකුත් වර්ෂයේ දී එය රු.මිලියන 103 ක් වූයෙන් මෙම වියදමේ සියයට 47 ක අඩුවීමක් දැක්වුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව කොමිෂන් සභාවේ සමාලෝචිත වර්ෂයේ ආදායමෙහි හා වියදමෙහි සැලකිය යුතු විචලනයන් පහත දැක්වේ.

| | 2015 රු.මිලියන | 2014 රු.මිලියන | විචලනය (හිතකර/(අහිතකර)) රු.මිලියන | % |
|---|---|---|---|---|
| සෙස් අරමුදලින් මාරු කිරීම් | 353 | 334 | 19 | 5.7 |
| විවිධ ආදායම හා ප්‍රදාන හඳුනාගැනීම | 16 | 18 | (2) | (11.1) |
| සේවක මණ්ඩල හා පරිපාලන පිරිවැය | (294) | (274) | (20) | (7.3) |
| ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන වියදම් | (55) | (103) | 48 | 46.6 |
| වර්ෂය සඳහා අතිරික්තය/(ඌනතාවය) | 32 | (13) | 45 | 346.1 |

ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන කාර්යයන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ මුළු වියදමින් සියයට 16 ක් පමණක් වැය කර තිබූ බව නිරීක්ෂණය වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 27 ක් විය. තවද සමාලෝචිත වර්ෂයේ මුළු වියදමින් සියයට 51 ක් පුද්ගල පඩිනඩි සඳහා දරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

#### 4.1.1 කොමිෂන් සභාවේ අංශ පිළිබඳ කාර්යසාධනය

**(අ) අධීක්ෂණ අංශය**

2015 දෙසැම්බර් 31 දිනට මෙම අංශයේ විෂය පථය යටතේ අස්තිත්ව 128 ක් විය. අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී අස්තිත්ව 102 ක් පරීක්ෂා කිරීමට සැලසුම් කර තිබුණද විශේෂ පරීක්ෂා කිරීම් 4 ක් හැරුණුවිට අස්තිත්ව 72 ක් පමණක් පරීක්ෂා කර තිබූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 92 කට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය අවසානයට සියයට 70 ක් විය.

**(ආ) සංස්ථා කටයුතු අංශය**

i. වෙළඳපොළ අතරමැදියන් හා ආයෝජකයින්ගෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු පැමිණිලි 85 කින් පැමිණිලි 82 ක් හෙවත් සියයට 96 ක් මෙම අංශය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විසඳා තිබුණි.

ii. කොමිෂන් සභා පනතේ 28 වගන්තිය යටතේ සමාලෝචිත වර්ෂය තුළ අනුමත කරන ලද එම අවස්ථාවේ නොවන මාරු කිරීම් (Off the floor transfers) සංඛ්‍යාව 108 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ 162 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 33 ක අඩුවීමක් දැක්වුණි.

iii. සම්පූර්ණ සමාලෝචනය සඳහා ලැබුණු වාර්ෂික වාර්තා මුළු සංඛ්‍යාව 124 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළදී නිම කරන ලද වාර්තා සංඛ්‍යාව 108 ක් හෙවත් සියයට 87 ක් පමණක් විය.

(ඇ) විමර්ශන අංශය

සමාලෝචිත වර්ෂය අවසානය දක්වා විමර්ශන අංශය විසින් කටයුතු කරන ලද පැමිණිලි 19 කින් පැමිණිලි 5 ක් නිමකර තිබුණි. පැමිණිලි 4 ක් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කර තිබූ අතර එක් පැමිණිල්ලක් කොළඹ කොටස් වෙළඳපොළට (Colombo Stock Exchange) යොමුකර තිබුණි. මේ අතර වෙනත් පැමිණිල්ලක් ආවේක්ෂණ හා විමර්ශන කමිටුව මඟින් තවදුරටත් විමර්ශනය සඳහා එම කමිටුවට යොමුකර තිබූ අතර ඉතිරි පැමිණිලි 8 එහි විමර්ශන ක්‍රියාවලියේ පැවතුණි.

## 4.2 මානව සම්පත් (HR) කළමනාකරණය

**ඒක සේවක පිරිවැය**

සමාලෝචිත වර්ෂය සඳහා හා පෙර වර්ෂ 3 ක් සඳහා ඒක සේවක පිරිවැය පහත දැක්වේ.

| වර්ෂය | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|
| මුළු සේවක පිරිවැය (රු.) | 178,614,001 | 166,060,617 | 159,203,688 | 140,311,036 |
| සේවකයින් සංඛ්‍යාව | 75 | 80 | 83 | 82 |
| එක් සේවකයෙකුට පිරිවැය (රු.) | 2,381,520 | 2,075,751 | 1,918,116 | 1,711,110 |
| විචලනය (ප්‍රතිශතය) | 14.7 | 8.2 | 12 | 8 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා එක් සේවකයෙකුට පිරිවැය සියයට 14.7 කින් වැඩි වී තිබුණි. “ජීවන වියදම් දීමනාවට අදාළව රජයේ වැඩි කිරීම් ලබාදීම, විශේෂ දීමනා හා අලුතෙන් හඳුන්වා දෙන ලද මාසික දීමනා ලබාදීම හේතුවෙන් සේවක පිරිවැය වැඩි වූ බවත්, ඊට අමතරව සේවක පිරිවැය වැඩිවීම සඳහා වාර්ෂික වැටුප් වර්ධක හේතු වූ බවත් ” සභාපති විසින් මා වෙත දන්වා තිබුණි.

**5.** **අයවැය පාලනය**

**------------------**

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සියයට 35 සිට සියයට 100 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6.** **පද්ධති හා පාලන**

**-----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපතිගේ අවධානයට වරින් වර යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුවේ.

අයවැයකරණය - සමහර අවස්ථාවලදී අයවැයගත සම්පූර්ණ වියදම උපයෝජනය කර නොතිබුණි.